සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது/
All Rights Reserved]

**08 | S | I,II**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2568 - පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2024 (2025)

## (08) සමාජවිද්‍යාව - I, II

පැය තුනයි

### සමාජවිද්‍යාව - I පත්‍රය

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

සැලකිය යුතුයි :

※ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.

※ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

※ ඔබට පිළිතුරු ලිවීමට ලබාදෙන පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න. එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

1. සමාජවිද්‍යාව විෂය විවිධ දිශානති ඔස්සේ වර්ධනය වීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක් ද?

    (1) න්‍යාය මත ගොඩනැගීම   (2) ප්‍රායෝගික පදනම
    (3) විවිධ සංකල්ප තිබීම   (4) සමාජ චර්යාව

2. එමිල් ඩුර්කයිම් (Emile Durkheim) සමාජය පිළිබඳව විස්තර කිරීමේදී හඳුන්වාදුන් සංකල්පය කුමක් ද?

    (1) අනෝමියත්වය   (2) ආර්ථික නියතිවාදය
    (3) නිලබල ක්‍රමය   (4) සමාජ ගතිකත්වය

3. සාම්ප්‍රදායික බටහිර සමාජය නවීන සමාජය දක්වා වෙනස්වීමට, ජෝර්ජ් රිට්සර් (George Ritzer) දැක්වූ කරුණු පමණක් ඇතුළත් වරණය කුමක් ද?

    (1) ගෝලීයකරණය, සමාජවාදයේ නැගීම, දේශපාලන ප්‍රතිසංස්කරණ
    (2) වැඩවසම් වාදයේ නැගීම, කාර්මික විප්ලවය, ආගමික ප්‍රතිසංස්කරණ
    (3) නාගරීකරණය, ධනවාදයේ නැගීම, බටහිරකරණය
    (4) නාගරීකරණය, කාර්මික විප්ලවය, විද්‍යාවේ වර්ධනය

4. සමාජවිද්‍යාවේ මූලික සංකල්ප කිහිපයක් 'X' තීරුවේ ද, බෞද්ධ දර්ශනයේ කේන්ද්‍රීය ඉගැන්වීම් කිහිපයක් 'Y' තීරුවේ ද දැක්වේ.

| 'X' | 'Y' |
|---|---|
| i. සමාජ පාලනය | A – අනිත්‍යතාව |
| ii. තත්ත්වය හා කාර්යභාරය | B – පින්/පව් හා කුසල්/අකුසල් |
| iii. සමාජ වෙනස්වීම | C – සදිසා නමස්කාරය |

ඉහත 'X' තීරුවේ දැක්වෙන සංකල්ප 'Y' තීරුවේ සඳහන් ඉගැන්වීම් සමග නිවැරදි අනුපිළිවෙළට ගැළපූවිට ලැබෙන පිළිතුර කුමක් ද?

(1) A, C සහ B   (2) B, C සහ A   (3) C, A සහ B   (4) C, B සහ A

[ 2 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

5. බෞද්ධ සමාජවිද්‍යාවේ පදනම ලෙස හඳුනාගත හැකි ප්‍රධාන සංකල්ප දෙක මොනවා ද?
   (1) න්‍යායාත්මක හා ව්‍යවහාරික බව
   (2) ලෞකික හා ආධ්‍යාත්මික බව
   (3) දර්ශනය හා චරණය
   (4) ජීවවිද්‍යාත්මක හා ස්වාභාවික බව

6. 'පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි' යන සිල් පදයට අනුගතව චර්යාව හැඩගසා ගැනීමෙන් ආරක්ෂා වන්නේ කුමන අයිතිය ද?
   (1) දේපළ පරිහරණය
   (2) සත්‍යවාදී තොරතුරු දැනගැනීම
   (3) බියෙන් තොරව ජීවත්වීම
   (4) පුද්ගල හා සමාජ සෞඛ්‍යය රැකීම

7. බුදු දහමේ ඉගැන්වීම්වලට අනුව බෞද්ධ සමාජ ස්තරායනයේ පදනම වනුයේ,
   (1) ජාතියයි.
   (2) කුලයයි.
   (3) ස්ත්‍රී පුරුෂ බවයි.
   (4) සිදු කරන ක්‍රියාවයි.

8. සමාජ වෙනස්වීම් පිළිබඳ වඩාත් නිවැරදි වරණය මින් කුමක් ද?
   (1) කෙටිකාලීනව භෞතික පරිසරයේ සිදුවන වෙනස්වීම්
   (2) දිගුකාලීනව මානවයාගේ සිදුවන වෙනස්වීම්
   (3) සාපේක්ෂව ජීවීන් අතර සිදුවන වෙනස්වීම් සමුදාය
   (4) දිගුකාලීනව අඛණ්ඩව සිදුවන වෙනස්වීම් සමුදාය

9. කාල් මාක්ස්ගේ (Karl Marx's) සමාජ පරිණාම විග්‍රහය අනුව වර්තමාන ලෝකය අවතීර්ණ වී ඇති සමාජ අවධිය කුමක් ද?
   (1) ධනවාදී අවධිය
   (2) වැඩවසම් අවධිය
   (3) වහල් අවධිය
   (4) කොමියුනිස්ට් අවධිය

10. සාධාරණව උපයාගත් ධනය කළමනාකරණය කර ගත යුතු ආකාරය ඉගැන්වෙන සූත්‍රය කුමක් ද?
   (1) කූටදන්ත සූත්‍රය
   (2) පරාභව සූත්‍රය
   (3) වසල සූත්‍රය
   (4) සිගාලෝවාද සූත්‍රය

● අංක **11** සහ **12** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන සමාජ ලක්ෂණ උපයෝගී කරගන්න.

A – මිථ්‍යා විශ්වාස මත පරාධීනව ජීවත්වීම
B – නීති පද්ධතියක් කේන්ද්‍ර කරගත් සමාජ පාලන ක්‍රම සංවිධානය වීම
C – ලාභය හා ශ්‍රම විභජනය මත පදනම් වූ නිෂ්පාදන ආර්ථික ක්‍රියාවලියක නිරත වීම
D – විද්‍යාත්මක දැනුම පදනම් කර ගෙන තර්කානුකූලව හා නිර්මාණාත්මකව ක්‍රියා කිරීම
E – අවශ්‍යතාවන් සියල්ල සමාජ කණ්ඩායම තුළින්ම සපුරා ගැනීම
F – සිරිත් විරිත් හා සම්ප්‍රදායන් මත පදනම් ව ක්‍රියා කිරීම

11. ප්‍රාථමික සමාජවල දක්නට ඇති මූලික ලක්ෂණ පමණක් දැක්වෙන වරණය කුමක් ද?
   (1) A, B, C
   (2) A, E, F
   (3) B, D, E
   (4) B, E, F

12. නූතන සමාජවලට ආවේණික සමාජ ලක්ෂණ පමණක් සඳහන් වරණය කුමක් ද?
   (1) A, C, D
   (2) B, C, D
   (3) B, D, E
   (4) C, D, F

13. බහු සංස්කෘතික සමාජයක පුරවැසියකු සතු වටිනාම ගුණාංගය වන්නේ,
   (1) අන්‍ය සංස්කෘතිවලට ගරු කිරීමයි.
   (2) මහා ජාතියේ සංස්කෘතියට පමණක් ගරු කිරීමයි.
   (3) අන්තර් ආගමික විවාහ ප්‍රවර්ධනය කිරීමයි.
   (4) අන්‍ය ආගම් වැළඳ ගැනීමයි.

[ 3 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

2184

- පහත සඳහන් A, B, C සහ D යන සිද්ධි යුගල අධ්‍යයනය කර, අංක 14 සහ 15 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – (i) කර්මාන්ත සඳහා යන්ත්‍ර සූත්‍ර භාවිතය
(ii) නිෂ්පාදන ධාරිතාව

B – (i) නව මාධ්‍ය පද්ධතියේ නවීකරණය
(ii) සමාජයේ හුදකලාබව

C – (i) නීතියේ ආධිපත්‍යය
(ii) සමාජ විරෝධී චර්යා

D – (i) සම්පත් බෙදීයාමේ විෂමතාව
(ii) ඇති - නැති පරතරය

14. අංක (i) හි වැඩිවීම, අංක (ii) හි වැඩිවීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක මොනවා ද?
(1) A සහ C (2) A සහ D (3) B සහ C (4) C සහ D

15. අංක (i) හි වැඩිවීම, අංක (ii) හි අඩුවීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක මොනවා ද?
(1) A සහ B (2) A සහ C (3) B සහ C (4) B සහ D

16. බහු සංස්කෘතික සමාජයක සහජීවනයෙන් ක්‍රියා කිරීමෙන් ලැබිය හැකි සුවිශේෂී ප්‍රයෝජනය වන්නේ,
(1) හැකි සෑම අවස්ථාවකදීම පුද්ගලයින්ට උදව් කළ නොහැකි වීමයි.
(2) විදේශ රාජ්‍යයන් ආක්‍රමණය කළ හැකි වීමයි.
(3) අන්‍ය සංස්කෘතියට උදව් කළ නොහැකි වීමයි.
(4) එක් ජාතියක් ලෙස සමගියෙන් ජීවත්වීමට හැකි වීමයි.

17. බ්‍රිතාන්‍ය මානවවිද්‍යාවේ පියා ලෙස සලකනු ලබන්නේ කවරෙක් ද?
(1) ඊ.බී. ටයිලර් (E.B. Tylor) (2) රේමන්ඩ් ෆර්ත් (Raymond Firth)
(3) බී. මැලිනොව්ස්කි (B. Malinowski) (4) රැල්ෆ් ලින්ටන් (Ralph Linton)

18. සංස්කෘතිය සම්ප්‍රේෂණය කරනු ලබන කේන්ද්‍රීය සාධකය කුමක් ද?
(1) අන්තර්ජාලය (2) පාසල (3) ආගම (4) භාෂාව

19. වර්තමාන ලෝකයේ සංස්කෘතික සම්මිශ්‍රණය සිදුවීම කෙරෙහි බලපාන ලද ප්‍රධාන හේතුව වනුයේ,
(1) වෙළෙඳ සබඳතා පුළුල් වීමයි.
(2) විශ්ව ගම්මානයක් බවට පත්වීමයි.
(3) විවිධ රටවල දේශපාලන ක්‍රියාවලියයි.
(4) සමාජයේ සිදුවූ කාර්මීකරණයයි.

20. 'සංස්කෘතිය' සම්බන්ධයෙන් වඩාත් නිවැරදි අර්ථකථනය මින් කුමක් ද?
(1) ජන කවි, නාට්‍ය, මූර්ති, කැටයම් ආදී සෞන්දර්යාත්මක නිර්මාණ එකතුවයි.
(2) සිරිත් විරිත්, සාරධර්ම, අගනාකම්, සම්ප්‍රදායන් ආදි දැනුම් පද්ධතීන්ගේ එකතුවයි.
(3) මිනිසා විසින් නිර්මාණය කරනු ලබන භෞතික හා අභෞතික සියල්ලේ එකතුවයි.
(4) ගෘහ නිර්මාණ, කර්මාන්තශාලා, වාරි කර්මාන්තය, උපකරණ හා යන්ත්‍ර සූත්‍රවල එකතුවයි.

21. ශ්‍රී ලාංකේය සමාජයේ පරිවර්තනයකට හේතු වූ 1815 වර්ෂයේදී සිදු වූ සුවිශේෂී සිදුවීම වන්නේ,
(1) පෘතුගීසින් උඩරට අල්ලා ගැනීමයි.
(2) චෝලයින්ගේ ආක්‍රමණයයි.
(3) ලන්දේසීන්ගේ පැමිණීමයි.
(4) ඉංග්‍රීසින්ගේ යටත් විජිතයක් වීමයි.

22. පුද්ගලයා පළමුවරට සමාජයේ සාමාජිකයකු බවට පත්වන්නේ,
(1) උපතිනි. (2) සමවයස් කණ්ඩායමෙනි.
(3) පාසල් පරිසරයෙනි. (4) රැකියා ස්ථානයෙනි.

[ 4 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

23. ප්‍රජාතන්ත්‍රවාදී පාලන සංකල්පය පිළිබඳ කරුණු දැක්වෙන බෞද්ධ සූත්‍රය කුමක් ද?
   (1) මහා මංගල සූත්‍රය
   (2) අග්ගඤ්ඤ සූත්‍රය
   (3) වසල සූත්‍රය
   (4) කාලාම සූත්‍රය

24. ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික සමාජය පිළිබඳ කරුණු දැක්වෙන කෘතීන් කිහිපයක් 'X' තීරුවේ ද ඒවායේ කතුවරුන් 'Y' තීරුවේ ද දැක්වේ.

| 'X' | 'Y' |
|---|---|
| i. එදා හෙළදිව (An Historcal Relation of the Island of Ceylon) | A – නන්දදේව විජේසේකර |
| ii. ලංකා ජනතාව (The Sinhalese) | B – පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි |
| iii. අපේ සංස්කෘතිය (Our Culture) | C – රොබට් නොක්ස් |

ඉහත 'Y' තීරුවේ සඳහන් කතුවරුන් 'X' තීරුවේ දී ඇති කෘතීන් හා අනුපිළිවෙළින් ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?
   (1) A, C සහ B
   (2) B, C සහ A
   (3) C, A සහ B
   (4) C, B සහ A

25. ශ්‍රී ලංකාවේ උත්තරීතර අධිකරණ ආයතනය කුමක් ද?
   (1) ශ්‍රේෂ්ඨාධිකරණය
   (2) දිසා අධිකරණය
   (3) මහාධිකරණය
   (4) අභියාචනාධිකරණය

● අංක **26** සහ **27** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන ලක්ෂණ උපයෝගී කරගන්න.

A – චාරිත්‍ර වාරිත්‍ර
B – ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
C – සාරධර්ම
D – පිරිවෙන් අධ්‍යාපන පනත
E – සම්ප්‍රදායන්
F – දණ්ඩ නීති සංග්‍රහය

26. අවිධිමත් සමාජ පාලන ක්‍රමවේද පමණක් දැක්වෙන වරණය කුමක් ද?
   (1) A, B සහ C
   (2) A, C සහ E
   (3) B, D සහ E
   (4) C, E සහ F

27. විධිමත් සමාජ පාලන ක්‍රමවේද පමණක් දැක්වෙන වරණය කුමක් ද?
   (1) A, C සහ D
   (2) A, D සහ F
   (3) B, D සහ F
   (4) D, E සහ F

28. යුක්තිය පසිඳලීමෙන් පසු වරදකරුවන්ට දඬුවම් නියම කිරීම හා නිවැරදිකරුවන් නිදොස්කොට නිදහස් කිරීමේ වගකීම පැවරී ඇති ආයතනය කුමක් ද?
   (1) පොලීසිය
   (2) බන්ධනාගාරය
   (3) පාර්ලිමේන්තුව
   (4) අධිකරණය

29. පංච නීවරණ අතුරින් ව්‍යාපාද දුරු කර ස්වයං පාලනය ඇති කර ගැනීම සඳහා වඩාත් ම සුදුසු භාවනා ක්‍රමය කුමක් ද?
   (1) බුද්ධානුස්සතිය
   (2) මෛත්තානුස්සතිය
   (3) අසුභානුස්සතිය
   (4) මරණානුස්සතිය

30. මූලික අයිතිවාසිකම් කඩවූ අවස්ථාවක පැමිණිලි කිරීමට ඔබ යා යුත්තේ,
   (1) ශ්‍රේෂ්ඨාධිකරණයට ය.
   (2) දිසා අධිකරණයට ය.
   (3) මහාධිකරණයට ය.
   (4) පළාත්බද මහාධිකරණයට ය.

[ 5 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

31. සිවිල් නීතිය යටතට අයත්වන වැරදි ඇතුළත් වරණය වන්නේ කුමක් ද?
    (1) මිනීමැරුම්, ළමා අපචාර, විවාහ සම්බන්ධ ගැටලු,
    (2) මිනීමැරුම්, ළමා අපචාර, මංකොල්ලකෑම්,
    (3) විවාහ සම්බන්ධ ගැටලු, උරුමයන් සම්බන්ධ ගැටලු, ඉඩම් ආරවුල්
    (4) විවාහ සම්බන්ධ ගැටලු, ළමා අපචාර, මංකොල්ලකෑම්

32. ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීති නිලධාරියා වන නීතිපතිවරයා පත් කරනු ලබන්නේ,
    (1) අධිකරණ ඇමති ය.
    (2) පාර්ලිමේන්තුව ය.
    (3) අධිකරණ සේවා කොමිසම ය.
    (4) ජනාධිපති ය.

33. සමාජ ගැටලු හමුවේ සමාජවිද්‍යාඥයාගේ ප්‍රමුඛ කාර්යභාරය වනුයේ,
    (1) සමාජ ගැටලුවලට විසඳුම් ලබාදීම ය.
    (2) සමාජ ගැටලු පිළිබඳ සමාජය දැනුවත් කිරීම ය.
    (3) සමාජ ගැටලු අධ්‍යයනය කර ඒ පිළිබඳ දැනුම නිර්මාණය කිරීම ය.
    (4) සමාජ ගැටලු ඇතිවීම වැළැක්වීම ය.

34. උසස් අධ්‍යාපනය ලැබීම සමාජ ගැටලුවක් වීමට බලපාන ප්‍රධාන සාධකය මින් කුමක් ද?
    (1) අධ්‍යාපනයට ගැළපෙන රැකියා අවස්ථා නිර්මාණය නොවීම.
    (2) උසස් අධ්‍යාපන කටයුතු සඳහා වැඩි කාලයක් ගත වීම.
    (3) අධ්‍යාපන කටයුතුවලට අධික වියදමක් දැරීමට සිදු වීම.
    (4) අධ්‍යාපන සහතිකයට සමාජ පිළිගැනීමක් නොමැති වීම.

35. පහත සඳහන් කරුණු අතුරින් මානව පරිසරයට හානි ඇති කරන ප්‍රධාන සාධකය කුමක් ද?
    (1) ආගමික ඇදහිලි හා විශ්වාස
    (2) ලෙඩරෝග හා වසංගත ව්‍යාප්තිය
    (3) ජීවීන්ගේ වාසස්ථාන සුරක්ෂිතවීම
    (4) පරිසර සංරක්ෂණ කටයුතු

36. සමීප මිතුරකු ඔබව මත්ද්‍රව්‍ය භාවිතයට පොළඹවා ගැනීමට වෑයම් කරයි නම් ඉන් වැලකීමට ඔබ කළ යුතු වැදගත්ම කාර්යය වන්නේ,
    (1) මිතුරා මගහැර යාමයි.
    (2) ඔහු සමග අමනාප වීමයි.
    (3) අමනාපවේයැයි සිතා එක් වරක් එකඟවීමයි.
    (4) එය එක හෙළාම ප්‍රතික්ෂේප කිරීමයි.

37. පුද්ගලයකු HIV ඒඩ්ස් වැනි දරුණු ලෙඩරෝගවලින් වැලකී, මත්ද්‍රව්‍ය භාවිතයෙන් බැහැර ව සතුටින් හා ප්‍රබෝධවත්ව ජීවත්වීමට උත්සාහ කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ කුමක් ද?
    (1) කායික යහපැවැත්ම ඇතිකර ගැනීම
    (2) ශාරීරික යෝග්‍යතාව පවත්වා ගැනීම
    (3) ගුණාත්මක ජීවිතයක් ගත කිරීම
    (4) සාමකාමී ජීවිතයක් ගත කිරීම

[ 6 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

- පහත සඳහන් සිද්ධිය ඇසුරින් අංක **38** සිට **40** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

6 -13 ශ්‍රේණි පවත්වන අග නගරයේ පිරිවෙනක 6 ශ්‍රේණියට ඇතුළත් වූ සිසුන් 35 දෙනාගෙන් එක් සිසුවකු පන්ති කාමරයේ රඳවා තබා ගැනීම ඉතා අපහසු කාර්යයක් බව පන්තිභාර ගුරුතුමාට අවබෝධ විය. එබැවින් ඔහු දරුවා අනෙක් සිසුන් සමඟ කටයුතු කරන ආකාරය පිළිබඳ සොයා බැලීමට තීරණය කළේ ය. ඒ අනුව පහත සඳහන් ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමට ගුරුවරයා සැලසුම් කරන ලදී.

A – ඉගෙනීමේ හා වෙනත් ක්‍රියාකාරකම්වල දරුවා යෙදෙන ආකාරය පන්තිභාර ගුරුවරයා තමන් විසින් ම පන්ති කාමරයේදී සොයා බැලීම.

B – දරුවා ගෙදර වැඩ නොකිරීම, අන් සිසුන් සමඟ ක්‍රියාකරන ආකාරය පිළිබඳ සොයා බැලීම.

C – දරුවාට නොදැනෙන ලෙස ක්‍රීඩා කටයුතු හා වෙනත් විෂයය සමගාමී ක්‍රියාකාරකම් සිදු කරන ආකාරය සොයා බැලීම.

D – මව හා පවුලේ අනෙකුත් සාමාජිකයන්ගෙන් තොරතුරු ලබා ගැනීම.

38. පන්ති භාර ගුරුවරයා විසින් *A* අක්ෂරයෙන් දක්වා ඇති ක්‍රියාකාරකම සඳහා භාවිත කරන දත්ත රැස් කිරීමේ ක්‍රමය කුමක් ද?

(1) ප්‍රශ්නාවලිය (2) සම්මුඛ සාකච්ඡාව
(3) සහභාගිත්ව නිරීක්ෂණය (4) ඍජු නිරීක්ෂණය

39. C ලෙස දක්වා ඇති තොරතුරු ලබා ගැනීමට අනුගමනය කළ යුත්තේ කුමන දත්ත රැස් කිරීමේ ක්‍රමය ද?

(1) වක්‍ර නිරීක්ෂණය (2) සම්මුඛ සාකච්ඡාව
(3) සහභාගිත්ව නිරීක්ෂණය (4) ඍජු නිරීක්ෂණය

40. D අක්ෂරයෙන් දැක්වෙන කණ්ඩායමෙන් දත්ත රැස්කරගත හැකි වඩාත් ම සුදුසු ශිල්ප ක්‍රමය වන්නේ කුමක් ද?

(1) ප්‍රශ්නාවලිය (2) සම්මුඛ සාකච්ඡාව
(3) සහභාගිත්ව නිරීක්ෂණය (4) වක්‍ර නිරීක්ෂණය

* *

[ 7 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

**08 S I,II**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

## 2568 - පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2024 (2025)

## (08) සමාජවිද්‍යාව - I, II

### සමාජවිද්‍යාව - II පත්‍රය

* පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**1.** (i) මූලික සමාජ සංස්ථා දෙකක් නම් කරන්න.

(ii) බුදුදහමට අනුව සමාජ දියුණුවේ ආකාර දෙක ලියා දක්වන්න.

(iii) සමාජ වෙනස්වීම කෙරෙහි බලපාන සාධක දෙකක් ලියා දක්වන්න.

(iv) සමාජවිද්‍යාඥයින් විසින් පෙන්වා දී ඇති නවීකරණයේ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(v) කිතුණු සංස්කෘතියේ බලපෑමෙන් ශ්‍රී ලාංකේය සංස්කෘතියට එක්වූ අංග දෙකක් සඳහන් කරන්න.

(vi) බෞද්ධ විහාරස්ථානයකට ඇතුල්වීමේදී අනුගමනය කළ යුතු ධර්මතා දෙකක් සඳහන් කරන්න.

(vii) ශ්‍රී ලාංකේය සමාජය බහුවිධ සමාජයක් වීමට හේතු වූ කරුණු දෙකක් ලියා දක්වන්න.

(viii) නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවා ඇති ආයතන දෙකක් සඳහන් කරන්න.

(ix) බෞද්ධ ඉගැන්වීම්වලට අනුව ජනවාර්ගික අර්බුදයක් ඇතිවීම වළක්වාගත හැකි කරුණු දෙකක් සඳහන් කරන්න.

(x) පර්යේෂණයක් සැලසුම් කිරීමේදී අනුගමනය කළ යුතු මූලික පියවර දෙකක් ලියා දක්වන්න.

*(ලකුණු 02 × 10 = 20 යි)*

**2.** (i) 'තත්ත්වය හා කාර්ය කොටස (කාර්යභාරය)' අතර සම්බන්ධය ඔබේ වචනයෙන් ලියන්න. *(ලකුණු 02 යි)*

(ii) සමාජානුයෝජන කාරක තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) දුගීකම සහ එය ඇතිවීමට බලපාන හේතු සාධකයක් අතර ඇති හේතුඵල සම්බන්ධය පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

**3.** (i) සමාජ සංවර්ධනයේ ප්‍රධාන අවධි දෙක ලියා දක්වන්න. *(ලකුණු 02 යි)*

(ii) නාගරීකරණය නිසා සමාජය තුළ සිදුවන වෙනස්කම් තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) රටක සංවර්ධනය සඳහා පාලකයින් දසරාජ ධර්මයන්ට අනුගතවීමේ වටිනාකම එහි ඇතුළත් කරුණු දෙකක් ඇසුරින් අගයන්න. *(ලකුණු 05 යි)*

**4.** (i) ශ්‍රී ලාංකේය අධ්‍යාපන පද්ධතිය වර්ධනයට පුරෝගාමී වූ වියතුන් දෙදෙනෙක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ඉස්ලාම් සංස්කෘතියේ දක්නට ලැබෙන ප්‍රධාන සංස්කෘතිකාංග තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) මහින්දාගමනය නිසා ශ්‍රී ලාංකේය සංස්කෘතියට හඳුන්වා දුන් වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

**5.** (i) බුදුදහමට අනුව සාධාරණත්වය හා යුක්තිය වෙනුවෙන් සමාජය පුහුණු කිරීමට භාවිත කර ඇති සුවිශේෂී ප්‍රවේශ දෙක සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) සතර බ්‍රහ්ම විහරණ අනුගමනය කිරීම මගින් සමාජයට ඇතිවන වාසි තුනක් ලියන්න. *(ලකුණු 03 යි)*

(iii) ස්වාමි-සේවක සම්බන්ධයෙහි ඇති වටිනාකම සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන සදිසා සංකල්පයේ කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

[ 8 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**6.** (i) සමාජ පාලනය අවශ්‍ය වීමට බලපාන හේතු **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ශ්‍රී ලාංකේය පැරණි ග්‍රාමීය සමාජය තුළ ප්‍රාදේශීය පාලකයින්ට ලබා දී තිබූ දණ්ඩන බලතල **තුනක්** සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) විහාරස්ථානයෙහි නිර්මාණය කර ඇති අපාය හා දිව්‍යලෝක දැක්වෙන සිතුවම් සමාජ පාලන කාරකයක් වන ආකාරය කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

**7.** (i) සමාජ මානවවිද්‍යාඥයින් විසින් හඳුනාගෙන ඇති සමාජ ගැටලු **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) සියදිවි නසාගැනීමට තුඩුදෙන හේතු **තුනක්** ලියා දක්වන්න. *(ලකුණු 03 යි)*

(iii) බෞද්ධ ඉගැන්වීම් අනුව සමාජ ගැටලු නිරාකරණය කර ගැනීමට හැකි ආකාර **දෙකක්** සැකෙවින් විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

**8.** (i) සමාජවිද්‍යාත්මක පර්යේෂණවල මූලික අරමුණු **දෙක** නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) පර්යේෂණයක දී අවශ්‍ය තොරතුරු රැස්කිරීමේ ලිඛිත මූලාශ්‍රය **තුනක්** සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) පර්යේෂණ වාර්තාව සැකසීමේදී අවධානය යොමුකළ යුතු කරුණු **දෙකක්** දක්වා ඒ පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

* * *

Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka